ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**Communications Department**
30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka
Tel: 2477424, 2477423, 2477418
Fax: 2346257, 2477739
E-mail: dcommunications@cbsl.lk, communications@cbsl.lk
Web: www.cbsl.gov.lk

# Press Release

| | |
|---|---|
| Issued By | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| Date | |

**සිතා මතා විකෘති කරන ලද, හානි කරන ලද හා වෙනස් කරන ලද ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටු.**

සිතා මතා විකෘති කරන ලද, හානි කරන ලද හා වෙනස් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් හුවමාරු කිරීමේදී මහජනතාව විසින් මුහුණ දෙමින් සිටින අපහසුතාවයන් මෙන්ම අති විශාල මහජන ඉල්ලීම් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, එවැනි ව්‍යවහාර මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් හුවමාරු කර ගැනීමේ කාල සීමාව 2018 මාර්තු 31 දක්වා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කර ඇත.

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටු සිතාමතා විකෘති කිරීම, හානි කිරීම හෝ වෙනස් කිරීම 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ දඩ මුදලකට යටත් කිරීම හෝ සිරගත කිරීම හෝ එම දඬුවම් දෙකම ලබා දිය හැකි වරදකි. මුදල් නීති පනතේ රෙගුලාසි ඊ (Regulation E) යටතේ සිතා මතා විකෘති කරන ලද, හානි කරන ලද හෝ වෙනස් කරන ලද නෝට්ටු සඳහා කිසිදු හිමි කම් පෑමක් නොලබන අතර එවැනි නෝට්ටු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රඳවා ගත යුතුය.

ඒ අනුව, මෙවැනි මුදල් නෝට්ටු අත දරන්නා හට 2018 අප්‍රේල් 01 සිට එම නෝට්ටු වල මුහුණත වටිනාකමෙහි අලාභය දරා ගැනීමට සිදු වේ.

තවද, මෙවැනි පුරුදු වලින් වළකින ලෙස මෙන්ම ව්‍යවහාර මුදල් නෝට්ටු සිතා මතා විකෘති කිරීමෙන්, හානි කිරීමෙන් හා වෙනස් කිරීමෙන් වැළකී සිටීම මගින් රටෙහි වලංගු මුදල් නෝට්ටු වල වටිනාකම සහ විශ්වාසනීයත්වය ආරක්ෂා කර ගැනීමට සහය වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටියි.